ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
කළමනාකරණ අධ්‍යයන පීඨය
ව්‍යවසායකත්ව සහ කුඩා ව්‍යාපාර කළමනාකරණ උසස් සහතිකපත්‍ර පාඨමාලාව
අවසාන පරීක්ෂණය - 2025
OSC2405: ව්‍යවසායකයින් සඳහා මෙහෙයුම් කළමනාකරණය
කාලය: පැය (02) දෙකයි

*දිනය: 2025 මැයි 31* *වේලාව: පෙ.ව. 9. 30 - පෙ.ව. 11.30*

**උපදෙස්:**

- ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයීමේදී පැහැදිලි අත් අකුරු භාවිතා කරන්න.
- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

**ප්‍රශ්න 01**

සමාධි කුඩා ව්‍යාපාරයක් පවත්වාගෙන යන ව්‍යවසායිකාවක් වන අතර එහිදී ඇය තනි තනි පාරිභෝගික ඇණවුම් අනුව අභිරුචිකරණය කළ (customized) උපන්දින කේක් සකස් කරයි. සෑම කේක් එකක්ම පාරිභෝගිකයාගේ කැමැත්ත මත පදනම්ව විශේෂයෙන් නිර්මාණය කර ඇත.

(අ) මෙම අවස්ථාව සැලකිල්ලට ගෙන, කේක් සෑදීමේ ක්‍රියාවලියට සම්බන්ධ නිෂ්පාදන පද්ධතියේ ප්‍රධාන සංරචක (components of the production system) සැලසුම් කරන්න. (ලකුණු 10)

(ආ) සමාධි, අභිරුචිකරණය කළ (customized) කේක් සහ අනෙකුත් ආහාර ද්‍රව්‍ය සමඟ සාද සහ උත්සව සැලසුම් කිරීම සහ කළමනාකරණය කිරීම හරහා සේවා ලබා දීමෙන් ඇගේ ව්‍යාපාරය පුළුල් කිරීමට ද සැලසුම් කරයි. දී ඇති අවස්ථාව මත පදනම්ව, සමාධිගේ ව්‍යාපාරික ලක්ෂණ උදාහරණයක් ලෙස භාවිතා කරමින් භාණ්ඩ සහ සේවා (goods and services) අතර ලක්ෂණ ඉස්මතු කරන්න.
(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න 02**

(අ) බොහෝ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් පැහැදිලි නිෂ්පාදන සැලැස්මක් නොමැතිව ක්‍රියාත්මක වන අතර, ඒ හේතුවෙන් බොහෝ විට ප්‍රමාදයන්, සම්පත් නාස්තිය සහ පාරිභෝගික අතෘප්තිය වැනි ගැටළු වලට මුහුණ දෙයි.

මෙම අවස්ථාව සැලකිල්ලට ගනිමින්, සංවිධානයක සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීමේදී නිෂ්පාදන සැලසුම්කරණයේ (production planning) වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ආ) ඉක්මනින් අළෙවිවන පාරිභෝගික භාණ්ඩ (fast-moving consumer goods) සංවිධානයකට තොග පාලනයේ වැදගත්කම සුදුසු උදාහරණ සමඟ පැහැදිලි කරන්න. (ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න 03**

හිරුණි යනු පරිසර හිතකාමී නව සාප්පු බෑග් (eco-friendly shopping bag) පෙළක් හඳුන්වා දීමට කැමති කුඩා ව්‍යාපාර හිමිකාරියකි. ආයෝජනය කිරීමට පෙර මෙම නිෂ්පාදනය සඳහා පාරිභෝගික ඉල්ලුම තේරුම් ගැනීමට ඇය උත්සාහ කරයි.

(අ) ඔබ නිෂ්පාදන කළමනාකරුවෙකු ලෙස, පාරිභෝගික ඉල්ලුම (customer demand) හඳුනාගෙන නිවැරදි නිෂ්පාදනය තෝරා ගැනීමට ඇය අනුගමනය කළ යුතු පියවර පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ආ) පරිසර හිතකාමී සාප්පු බෑග් (eco-friendly shopping bag) සඳහා ඇයට භාවිතා කළ හැකි සරල අලෙවිකරණ සැලැස්මක් (marketing plan) යෝජනා කරන්න. (ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න 04**

ජනිත යනු බෝතල් කළ පළතුරු යුෂ නිෂ්පාදනය කිරීම සඳහා කුඩා කර්මාන්ත ශාලාවක් පිහිටුවීමට සැලසුම් කරන දේශීය නිෂ්පාදකයෙකි. ඔහු දැනට සුදුසු ස්ථානයක් තෝරා ගැනීමේ සහ අභ්‍යන්තර පිරිසැලසුම සැලසුම් කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී.

(අ) ඔහුගේ නව පලතුරු යුෂ කර්මාන්ත ශාලාව පිහිටුවීමට ස්ථානය තෝරාගැනීමේදී ඔහු සලකා බැලිය යුතු ප්‍රධාන සාධක විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

(ආ) නිෂ්පාදන පිරිසැලසුමක් (product layout) සහ ක්‍රියාවලි පිරිසැලසුමක් (process layout) අතර වෙනස දක්වන්න. පලතුරු යුෂ කර්මාන්ත ශාලාව සඳහා සුදුසු සැලසුමක් හේතු සහිතව නිර්දේශ කරන්න. (ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න 05**

ශීත කළ, කෑමට සූදානම් ආහාර (frozen ready-to-eat meals) පිළියෙළ කරන ආහාර නිෂ්පාදන සමාගමක්, නිෂ්පාදනවල ගුණාත්මක භාවයේ නොගැලපීම සහ ඇණවුම් ඉටු කිරීමේදී නිතර සිදුවන ප්‍රමාදයන් හේතුවෙන් ගැටළු වලට මුහුණ දී සිටී.

(අ) කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ පාරිභෝගික අපේක්ෂාවන් සපුරාලීම සඳහා සමාගම තුළ නිෂ්පාදන පාලන පද්ධති (production control system) හඳුන්වා දිය හැකි ආකාරය යෝජනා කරන්න.

(ලකුණු 10)

(ආ) ශීත කළ ආහාර නිෂ්පාදනයේදී තත්ත්ව පාලනයේ (quality control) වැදගත්කම පැහැදිලි කර, ස්ථාවර නිෂ්පාදන ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා ප්‍රායෝගික පියවර යෝජනා කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න 06**

පහත මාතෘකා යටතේ කෙටි සටහන් ලියන්න.

(අ) "මෙවලම් සම්පාදනය" (tooling up) යන සංකල්පය පැහැදිලි කර, අදාළ උදාහරණ භාවිතා කරමින් එහි වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 05)

(ආ) නිවැරදි කම්හල් සැලැස්මක් (good plant layout ) තිබීමේ වැදගත්කම සහ එය සංවිධානයේ සමස්ථ කාර්යක්ෂමතාවයට දායක විය හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ඇ) නිෂ්පාදන/සේවා සංවිධානවල වැඩ අධ්‍යයනය (work-study) සහ වැඩ අධ්‍යයනය භාවිතා කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ඈ) ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) සහ තොග කළමනාකරණයේදී එහි වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 05)

**(මුළු ලකුණු 20)**

**සියලු හිමිකම් ඇවිරිණි.**